<u>රාජ්‍ය සේවා කොමිෂන් සභාව</u>

<u>මහජන ආරක්ෂක අමාත්‍යාංශය</u>

<u>ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ සහකාර පාලක (දෙපාර්තමේන්තුමය) තනතුරු සඳහා නිලධාරීන් බඳවා ගැනීම - 2024</u>

ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ සහකාර පාලක (දෙපාර්තමේන්තුමය) තනතුරු පුරප්පාඩු 07ක් සඳහා බඳවා ගැනීම පිණිස මෙම දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු සුදුසුකම්ලත් ජ්‍යෙෂ්ඨ බලයලත් නිලධාරීන්ගෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි අයදුම්පත් කැඳවනු ලැබේ.

(අ). අයදුම්පත් කැඳවන අවසාන දිනය 2024 මාර්තු 11 දින වේ.

01. බඳවා ගැනීමේ ක්‍රමය

නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතරින්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහලම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයින් පුරප්පාඩු සංඛ්‍යාව සඳහා බඳවා ගනු ලැබේ. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද (අංක 06 යටතේ සඳහන්) ලකුණු ලබාදීමේ පටිපාටියට අනුකූලව යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

පත්වීම ක්‍රියාත්මක වන දිනය හා පත් කරනු ලබන සංඛ්‍යාව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

02. අවශ්‍ය සුදුසුකම්

I. ජ්‍යෙෂ්ඨ ආගමන විගමන නිලධාරී (ජ්‍යෙෂ්ඨ බලයලත් නිලධාරී) තනතුරේ වසර 05ක සේවා කාලයක් සම්පූර්ණ කිරීම.

II. අයදුම්පත් කැඳවන අවසන් දිනට පූර්වාසන්න වසර 05 තුළ සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

III. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූලව දඬුවමක් ලබා නොතිබීම.

සටහන: අයදුම්පත් කැඳවන අවසන් දිනට තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

03. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි

i. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/ වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය මඟින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

ii. මෙම පත්වීම වසරක පරිවාස කාලයකට යටත්ය. එම කාලය සතුටුදායක ලෙස සම්පූර්ණ කරනු ලබන නිලධරයන් තනතුරෙහි ස්ථිර කිරීමට කටයුතු කරනු ලැබේ. මෙම තනතුරට බඳවා ගෙන වසර 03ක් ඇතුලත බඳවා ගැනීම් පටිපාටියේ සඳහන් ආකාරයට පළමු වැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

iii. 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 හි සඳහන් විධිවිධාන අනුව, නියමිත රාජ්‍ය භාෂාවේ/ රාජ්‍ය භාෂාවන්හි ප්‍රවීණතාවය ලබා ගත යුතුය.

iv. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතිවලටද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයටද, රජයේ මුදල් රෙගුලාසිවලටද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලටද මෙම පත්වීම යටත් වේ.

v. ඉල්ලුම් කරනු ලබන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලබන අතර, ඔබ පත්වීම ලැබීමට සුදුසුකම් ලබන භාෂා මාධ්‍ය වනුයේ, ඔබ විසින් අයදුම්පත්‍රයේ සඳහන් කරනු ලබන භාෂා මාධ්‍ය වේ.

**04. වයස් සීමාව**

අදාළ නොවේ.

**05. වැටුප් පරිමාණය**

2016.02.25 දිනැති අංක 03/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන 1 අනුව මෙම තනතුරට අදාල මාසික වැටුප් පරිමාණය රු. 47,615 -10 x 1335 - 8 x 1,630 - 17 x 2170 - 110895 (SL-1-2016) වේ.

**06. යෝග්‍යතාවය ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලකුණු පටිපාටිය පදනම් කර ගනු ලැබේ.**

| අනු අංකය | විෂයය | ලකුණු | උපරිම ලකුණු |
|---|---|---|---|
| 01 | <u>ජ්‍යෙෂ්ඨත්වය</u><br>ජ්‍යෙෂ්ඨ බලයලත් නිලධාරී තනතුරේ වසර 05ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයට අමතරව අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට සම්පූර්ණ කර ඇති සක්‍රීය හා සතුටුදායක සේවා කාලය සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 1/2019 හා 01/2019(1) හි විධිවිධානයන්ට අනුව ලකුණු ලබා දෙනු ලැබේ.<br><br>(ජ්‍යෙෂ්ඨතම අයදුම්කරු වෙත උපරිම ලකුණු ප්‍රදානය කරනු ලබන අතර ඊට සමානුපාතිකව අනෙකුත් අයදුම්කරුවන් වෙත ජ්‍යෙෂ්ඨතාවය සඳහා ලකුණු ලබා දෙනු ඇත.) | | 60 |
| 02 | <u>කුසලතාවය</u><br><br>1. <u>අතිරේක අධ්‍යාපන සුදුසුකම්</u><br>විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කරන ආයතනයකින් හෝ ලබාගත්,<br><br>i. පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් හෝ ඊට ඉහළ සුදුසුකමක් සඳහා (වසර 01කට නොඅඩු) - ලකුණු 10<br>ii. උපාධියක් සඳහා - ලකුණු 08 | 10 | 40 |

| | | | |
|---|---|---|---|
| | 2 <u>ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය</u><br><br>විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ රජයේ රාජ්‍ය නිලධාරීන් පුහුණුකිරීමේ ආයතනයකින් ලබා ගත්,<br>i. ඩිප්ලෝමාවක් හෝ ඊට ඉහළ සුදුසුකමක් හෝ වෙනත් ආයතනයකින් ඉංග්‍රීසි භාෂාව සඳහා ලබාගත් NVQ 5 මට්ටමේ හෝ ඊට ඉහල මට්ටමේ සහතිකයක් සඳහා - ලකුණු 05<br>ii. IELTS (Academic) සමස්ථ ලකුණු 6.5 හෝ ඊට ඉහළ, TOEFL-IBT 79 හෝ ඊට ඉහළ, TOEFL- CBT 213. හෝ ඊට ඉහළ හෝ TOEFL- PBT 550 හෝ ඊට ඉහළ සුදුසුකමක් සඳහා - ලකුණු 04<br>iii. ඉංග්‍රීසි භාෂාව සඳහා ලබාගත් සහතික පත්‍රයක් හෝ වෙනත් ආයතනයකින් ඉංග්‍රීසි භාෂාව සඳහා ලබාගත් NVQ 3 මට්ටමේ සහතිකයක් සඳහා - ලකුණු 03<br><br>සටහන -<br>NVQ සුදුසුකම සහතිකයේ සඳහන් නොවේ නම් අදාළ ආයතනය මඟින් NVQ සුදුසුකම කුමන මටටමදැයි සහතික කර ඉදිරිපත් කළ යුතුය.<br><br>සැ.යු. උපරිම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ. | 05 | |
| | 3. <u>වෙනත් භාෂා ප්‍රවීණතාවය</u><br><br>විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව හෝ රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව යටතේ වන පුහුණු කිරීමේ ආයතනයකින් ඉංග්‍රීසි නොවන වෙනත් භාෂා සඳහා ලබා ගත් ඩිප්ලොමාවක් හෝ සහතික පත්‍රයක් සඳහා.<br><br>i. එක් භාෂාවකට අදාළ ඩිප්ලෝමාවකට - ලකුණු 2.5 බැගින් උපරිම භාෂා දෙකක් සඳහා ලකුණු ලබා දෙනු ලැබේ.<br><br>ii. එක් භාෂාවකට අදාළ සහතික පත්‍රයක් සඳහා ලකුණු 02 බැගින් උපරිම භාෂා දෙකක් සඳහා ලකුණු ලබා දෙනු ලැබේ. | 05 | |
| | 4. <u>පුහුණු පාඨමාලා</u><br><br>දෙපාර්තමේන්තුව විසින් ලබාදෙන ලද පුහුණු පාඨමාලා සඳහා ලබා ගත් සහතික (ඉංග්‍රීසි හා අනෙක් භාෂාවලට අමතරව වන සහතික සඳහා)<br><br>එක් සහතිකයකට ලකුණු 01 බැගින් උපරිම සහතික 05 ක් සඳහා | 05 | |
| | <u>05. පරිගණක දැනුම</u><br><br>විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින්<br><br>i. පරිගණක විද්‍යාව හෝ තොරතුරු තාක්ෂණය පිළිබඳ හෝ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව හෝ ඊට ඉහළ සුදුසුකමකට - ලකුණු 05<br>ii. පරිගණක විද්‍යාව හෝ තොරතුරු තාක්ෂණය පිළිබඳ උපාධියක් ලබා තිබීම - ලකුණු 04<br>iii. උපාධියක ප්‍රධාන විෂය ලෙස තොරතුරු තාක්ෂණය හදාරා තිබීම. - ලකුණු 03 | 05 | |

| | | | |
|---|---|---|---|
| | විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ රජයේ රාජ්‍ය නිලධාරීන් පුහුණුකිරීමේ ආයතනයකින් | | |
| | iv. පරිගණක විද්‍යාව හෝ තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාවක් හෝ වෙනත් ආයතනයකින් ලබා ගත් පරිගණක විද්‍යාව හෝ තොරතුරු තාක්ෂණය පිළිබඳ NVQ 5 හෝ ඊට ඉහළ මට්ටමේ ඩිප්ලෝමාවක් - ලකුණු 02 | | |
| | v. පරිගණක විද්‍යාව හෝ තොරතුරු තාක්ෂණය පිළිබඳ සහතික පත්‍රයක් හෝ වෙනත් ආයතනයකින් ලබා ගත් පරිගණක විද්‍යාව හෝ තොරතුරු තාක්ෂණය පිළිබඳ NVQ 3 මට්ටමේ සහතිකයක් සඳහා - ලකුණු 01 | | |
| | සටහන :<br>NVQ සුදුසුකම සහතිකයේ සඳහන් නොවේ නම් අදාළ ආයතනය මඟින් NVQ සුදුසුකම කුමන මට්ටමදැයි සහතික කර ඉදිරිපත් කළ යුතුය. | | |
| | **සැ.යු. උපරිම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.** | | |
| | 6. <u>ප්‍රශංසා</u> | 05 | |
| | එක් ප්‍රශංසාවක් සඳහා - ලකුණු 01 | | |
| | (පොදු 230 'බී' ආකෘතියෙන් පිරිනමන ලද ප්‍රශංසා 05 කට උපරිම වශයෙන් ලකුණු ලබා දෙනු ලැබේ.) | | |
| | (සමස්ථ සේවා කාලය තුළ ලබාගත් ප්‍රශංසා සහතික සලකා බලනු ලැබේ.) | | |
| | 7. සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය සඳහා | 05 | |

සටහන :

i. දෙපාර්තමේන්තුවේ තනතුරකට බඳවා ගැනීමේදී හෝ උසස් කිරීමේදී හෝ කාර්යක්ෂමතා කඩඉමකින් සමත් කිරීමක් සමඟ හෝ දැනටමත් සලකා බලා ඇති කිසිදු සුදුසුකමක් කුසලතාවය යටතේ ලකුණු පිරිනැමීම සඳහා සලකා බලනු නොලැබේ.
ii. කුසලතාව යටතේ එක් සුදුසුකමක් සඳහා ලකුණු පිරිනමනු ලබන්නේ එක් උපශීර්ෂයක් යටතේ පමණි.

## 07. අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය

යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින්ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි.

සම්මුඛ පරීක්ෂණයේදී සියලුම සහතික පත්වල මුල් පිටපත් හා අයදුම්කරු විසින්ම නිසි පරිදි සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතුය.

සම්මුඛ පරීක්ෂණයේදී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතා පත්‍ර පිළිගනු ලැබේ.

i. පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත.

ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය

08. අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය

i. මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත් ආකෘතිය අනුව සම්පූර්ණ කළ අයදුම්පත් 2024.03.11 වැනි දිනට හෝ ඊට ප්‍රථම " පාලක ජනරාල්, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව, සුහුරුපාය, බත්තරමුල්ල" යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතුවේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ii. ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘති පත්‍රයක් මෙම නිවේදනය අවසානයේ දැක්වේ. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කර මුල් පිටුව අංක 01 සහ ඉතිරිය 02,03 පිටුවලටද වන ලෙස සකස් කළ යුතු බවත් ඊට අදාළ තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිලිව ඇතුළත් කළ යුතුය.

iii. අයදුම්පත බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ "විධායක සේවා ගණයේ 111 ශ්‍රේණියේ සහකාර පාලක (දෙපාර්තමේන්තුමය) " යනුවෙන් සඳහන් කළ යුතුය.

iv. තම අයදුම්පත් , තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් ඉදිරිපත් කළ යුතුය.

v. මේ සමඟ ඇති ආදර්ශ අයදුම්පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාදවීම ගැන කිසිදු පැමිණිල්ලක් භාර ගනු නොලැබේ.

09. සාවද්‍ය තොරතුරු සැපයීම:

ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියාමාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

10. පුරප්පාඩුව පිරවීමේ හෝ නොපිරවීමේ අයිතිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

11. මෙම ගැසට් නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් හෝ පරස්පරතාවක් හෝ ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේය.

12. මෙම නිවේදනයේ සඳහන් නොවන කරුණක් සම්බන්ධයෙන් හෝ මෙම බඳවා ගැනීමේ ක්‍රියාමාර්ගය තුළ කිසියම් ගැටලුකාරී තත්ත්වයක් ඇති වුවහොත් ඒ පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගනු ලබන තීරණ අවසාන තීරණ වේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

..........................................................

ලේකම්

මහජන ආරක්ෂක අමාත්‍යාංශය

2024..02..09.....